**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ පුරප්පාඩු අටක් (08) ක් සඳහා 2026.03.11 දිනට සුදුසුකම්ලත් සක්‍රිය සේවයේ නියුතු සියළුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **තනතුරට අදාළ වැටුප් ක්‍රමය:-**

 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධි විධානයන්ට අනුව SL - 1- 2025 වැටුප් ඛණ්ඩයට අදාල වැටුප් පරිමාණය එනම්, රු.82,150 – 10 X 2,400 – 8 X 2,940 – 17 X 3,900 – 195,970/- (මාසික) මෙම තනතුරට හිමි වන අතර එහි 12 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

2. **වයස් සීමාව:-** අදාළ නොවේ.

3. **සපුරාලිය යුතු සුදුසුකම්:-**

 I. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සහකාර සුරාබදු කොමසාරිස් තනතුරේ අවම වශයෙන් වසරක (01) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. ( රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/PRO/07/1767/2022 හා 2025.12.19 දිනැති ලිපියට අනුව )
 II. සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට ස්ථිරව පත් කර තිබිය යුතුය.
 III. තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
 IV. පිළිගත් රාජ්‍ය ආයතනයකින් හෝ රජය පිළිගත් අධ්‍යාපන ආයතනයකින් (උදා:- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක) සාමාන්‍ය කළමනාකරණය, රජයේ මුදල් රෙගුලාසි හා ගිණුම්, ආයතන සංග්‍රහය විෂයයන් අන්තර්ගත වූ සති අටකට (08) නොඅඩු පාඨමාලාවක සහතිකය ලබා ගැනීම අවශ්‍ය වේ.
 V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව විනය දඬුවමක් ලබා නොතිබීම
 VI. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

 සැ.යු. :- අයදුම්කරුවන් විසින් ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව සනාථ කරන ලිපිලේඛන ද සත්‍ය පිටපත් බවට සහතික කර ඉදිරිපත් කළ යුතු අතර ඉහත IV හි සඳහන් සති අටකට නොඅඩු පාඨමාලාවට අදාළ සහතික ඉදිරිපත් කිරීමේදී ඊට අදාළ විෂයය අන්තර්ගතය ඇතුළත් ලේඛනයේ සහතික කළ පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

4. **උසස් කිරීමේ ක්‍රමය:-**

 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, ඉහත 03 ඡේදයෙහි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, එහිදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු වලට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

CamScanner

සහකාර සුරාබදු කොමසාරිස්වරුන්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීමට අදාළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු පරිපාටිය

| අනු අංකය | ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | **සේවා පළපුරුද්ද**<br>සහකාර සුරාබදු කොමසාරිස් කොමසාරිස් තනතුරට පත්වී වසර එකකට (01) පසුව එක් වසරකට ලකුණු 05 බැගින් | 60 | 60 |
| 02 | **කුසලතාවය** | | 35 |
| | (අ) කාර්ය සාධන ඇගයීම ( පූර්වාසන්න වසර 05 සඳහා )<br>I. විශිෂ්ට - ලකුණු 04<br>II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - ලකුණු 03<br>III. සාමාන්‍ය - ලකුණු 02 | 20 | |
| | (ආ) උසස් අධ්‍යාපන සුදුසුකම්<br>I. නීතිය<br>II. කළමනාකරණය,ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලන හා මානව සම්පත් කළමනාකරණය,<br>III. ආර්ථික විද්‍යාව හා බදුකරණය,<br>IV. මූල්‍ය කටයුතු හා ගිණුම්කරණය,<br>V. ගණිතය හා සංඛ්‍යානය,<br>VI. පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණය,<br>VII. සමාජ විද්‍යාව හා අපරාධ විද්‍යාව ,<br>VIII. මනෝවිද්‍යාව හා උපදේශනය,<br>IX. මත්පැන් , මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය,<br>X. සැපයුම් කළමනාකරණය ( Logistic Management )<br>XI. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව,<br>XII. ජීව විද්‍යාව හා ආහාර විද්‍යාව,<br>XIII. භාෂාව,<br>XIV. අවධානම් කළමනාකරණය,<br><br>යන ක්ෂේත්‍රයන්ට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>I. පශ්චාත් උපාධියක් සඳහා - ලකුණු 10<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 05<br>(මාස 6ක් හෝ පැය 1500 කට නොඅඩු)<br>සැ.යු.<br>• උපරිම ලකුණු ලබා දිය හැකි එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>• දැනටමත් සුරාබදු දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉමක් ලෙස හෝ උසස් කිරීමක් සඳහා වූ සුදුසුකමක් ලෙස සලකා බලා ඇති සුදුසුකමකට ලකුණු හිමි නොවේ.<br>• උපාධි සහතිකයට අදාළ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනද ඉදිරිපත් කළ යුතුය. | 10 | |

| | | | |
|---|---|---|---|
| | (ඇ) වෘත්තිය පුහුණු / විශේෂ පුහුණු - <br> දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු වලට අදාලව ලබා ඇති එක් පුහුණු සහතිකයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05කි. <br><br> සැ.යු.- <br> • මෙම පුහුණුවීම දෙපාර්තමේන්තුවේ රාජකාරී ක්ෂේත්‍රයට අදාළ විය යුතු අතර රජය විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන පුහුණු සහතික විය යුතුය. <br> • පුහුණු කාලය සතියකට වඩා වැඩි පුහුණු සහතික පමණක් සලකා බලනු ලැබේ. <br> • මින් පෙර උසස්වීමකදී ලකුණු ලබා දෙන ලද වෘත්තිය පුහුණු / විශේෂ පුහුණු සහතික සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 05 | |
| 03 | **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම** <br> • පෞරුෂත්වය ලකුණු 02 <br> • සන්නිවේදන හැකියාව ලකුණු 02 <br> • නායකත්ව කුසලතා ලකුණු 01 | 05 | 05 |
| | මුළු ලකුණු | | 100 |

ඉහත සුදුසුකම් තහවුරු කිරීම සඳහා අදාළ සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

5. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-**

- මෙම තනතුරට පත්වීම ක්‍රියාත්මක වන දිනය ලෙස සලකනුයේ, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවසාන දිනය වේ.
- සම්මුඛ පරීක්ෂණ දිනට සක්‍රිය සේවයේ සිටින නිලධාරීන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.

6. **අයදුම්පත් යොමු කිරීම :-**

- අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති සහකාර සුරාබදු කොමසාරිස්වරුන්, තමාගේ අයදුම්පත් මීට අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය මඟින් 2026.03.11 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.
- අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුර " යනුවෙන් පැහැදිලිවම සටහන් කළ යුතුය.

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය.

8. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී.එච්.එස්. පුල්ලපෙරුම
අතිරේක ලේකම්
මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන
අමාත්‍යාංශය

ලේකම්,
මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

දිනය - 2026.02.19

CamScanner

අයදුම්පත් අංකය:-............................................

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

**I. කොටස (නිලධාරියා විසින් සම්පූර්ණ කිරීමට)**

01. නිලධාරියාගේ නම -..........................................................................................................

02. ලිපිනය -

I. කාර්යාලීය :-..........................................................................................................

II. පෞද්ගලික :-..........................................................................................................

III. ස්ථිර පදිංචිය :-..........................................................................................................

03.

I. උපන්දිනය :-..........................................................................................................

II. ජාතික හැඳුනුම්පත් අංකය :-..........................................................................................

04.

(අ) මුල් පත්වීමේ :-

I. තනතුර -...........................................................................

II. පත්වීමේ දිනය -...........................................................................

III. සේවයේ ස්ථිර කළ දිනය -...........................................................................

(ආ) සහකාර සුරාබදු කොමසාරිස් තනතුර පිළිබඳ තොරතුරු :-

I. පත් වූ දිනය -...........................................................................

II. සේවා කාලය -...........................................................................

(ඇ) නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට පත් කළ දිනය -.......................................................

05. සහකාර සුරාබදු කොමසාරිස්වරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය,

සමත් වී තිබේද?.................................................. සමත් වූ දිනය -..........................................................

06. ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ ඔබ :

I. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද?..........................................................................
(නැත්නම් විස්තර කරන්න)

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව ඔබ විනයානුකූල දඬුවම් ලබා තිබේද?
..........................................................................................................
..........................................................................................................

07. (අ) ඔබ ලබා ඇති ප්‍රශංසා හා විශිෂ්ඨ සේවා සහතික

I. ..........................................................................................................

II. ..........................................................................................................

III. ..........................................................................................................

CamScanner